# ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

# තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. නියමිත සුදුසුකම් සහිත අපේක්ෂකයන් විසින් සකස් කර ගන්නා ලද තම ජීවදත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපන සහතික වල පිටපත්ද සමග **2024.01.26** දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, අංක: 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 8 යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (කරුණාකර ලියුම් කවරයේ වම් කෙළවරේ ඉහළ අයදුම්කරන තනතුර සඳහන් කරන්න.)

## 01. භාෂා පරිවර්තක (තනතුරු 01)

**සුදුසුකම් හා පළපුරුද්ද**

**තනතුර සඳහා සුදුසුකම්**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් උපාධියක්

සහ

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ට සම්මාන සාමාර්ථයක් ලබාගෙන තිබීම

සහ

සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තකයෙකු වශයෙන් පිළිගත් ආයතනයක වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

ආ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙමළ භාෂාව සමත් වී තිබීම

හා

සිංහල/දෙමළ භාෂා පරිවර්තකයෙකු වශයෙන් පිළිගත් ආයතනයක සේවා පළපුරුද්ද ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**වයස :** අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.)

**ව්‍යුහය හා වැටුප් පරිමාණය : MA 4-2016** රු. 37,970.00 - (10 × 755) (15 × 930) (5 × 1135) - රු. 65,145.00 මාසික

**සේවා හා කොන්දේසි**

1. තෝරාගනු ලබන අයදුම්කරුවන් තම වැටුපෙන් 10% ක දායකත්වයක් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) සපයන අතර, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් ඒ සඳහා වැටුපෙන් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තයන්ගේ අරමුදල (ETF) සඳහා 3% ක දායකත්වයක් ද කරනු ඇත.
2. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන්නේද යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.
3. රජයේ දෙපාර්තමේන්තුවක ස්ථිර තනතුරු දරන අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත්, ඔවුන් ආයතන, අධ්‍යක්ෂ ජනරාල් වෙතින් තමන් නිදහස් කර ගත යුතුය. අප ආයතනයේ සේවයේ නිරතව සිටින විට ඔවුනට විශ්‍රාම වැටුපට හිමිකමක් නොමැත.
4. ඉහත වැටුපට අමතරව රජය විසින් ලබාදෙන සියලු දීමනා හිමිවේ.
5. අදාළ තනතුර සඳහා පළපුරුද්ද ඇති අය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**අපැහැදිලි අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

පුවත්පත් කොමසාරිස්,
**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,**
155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 8.

©SELACNE